# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2154/6 - 2019 දෙසැම්බර් මස 16 වැනි සඳුදා - 2019.12.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය:* මීරි/ප්‍රා. ලේ./ඉ/01/14/07.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය:* LD/05/2009/A/207.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර*:

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, යටිගහ පත්තුවේ සුළු කොට්ඨාසයේ හීදියවල කැ. සි. අ. 510242 කලාප 01 ගමේ පිහිටි සර්වේ ජනරාල් වෙනුවට ගම්පහ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් 2019.09.03 දිනැතිව පිළියෙල කර ඇති කැඩැස්තර සිතියම් අංක 510242 කලාප 1 පත්‍ර 5 දරන පිඹුරේ කැබලි අංක 171 හා කැබලි අංක 172 දක්වා පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.9007ක් වූ පහත විස්තර කරන ඉඩම් කැබලි 02.

**කැබලි අංක 171**

ඉඩමේ නම: හීදියවල වැව; ඉඩමේ විස්තරය: වැව; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ජේ. පී. වීරසිංහ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1108.

**කැබලි අංක 172**

ඉඩමේ නම: හීදියවල වැව; ඉඩමේ විස්තරය: වැව; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඒ. ඒ. ධර්මදාස; ප්‍රමාණය: හෙක්ටයාර් 0.7899.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ ............... වැනි දින පූ.භා. 9.30ට මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද ..................... වැනි දිනට මත්තෙන් ඒ ඉඩම්/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. අයිතිවාසිකම් තහවුරු කිරීමට ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති ඔප්පු සහ අනෙකුත් ලියවිලිද පරීක්ෂණ දිනයේදී ඉදිරිපත් කළ යුතුයි.

වයි. අයි. එම්. සිල්වා,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මීරිගම.

2019 ඔක්තෝබර් මස 14 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මීරිගම.

1-10

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය:* POL/MDG/L/MKP/104/2.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය:* 4/3/201010/TR/289.

මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කවුඩුළුවැව මැදිරිගිරිය උප ප්‍රධාන ඇල ඉදි කිරීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට රජය අදහස් කරන බව ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

උතුරු මැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිංහල පත්තුවේ සුළු කොට්ඨාසයේ අංක 104 එකමුතුගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අ. භූ. පි. 11 අතුරු පිඹුරු අංක 662 පත්‍ර අංක 698 දරන සැළසුමේ පෙන්නුම් කර ඇති පහත විස්තර කරන ඉඩම් කැබලි :

**01. කැබලි අංක A 386**

ඉඩමේ නම: එකමුතුගම; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ල සහිත මිශ්‍ර බෝග වගාව, අංක 247, 3 වන පියවර එකමුතුගම පදිංචි ජයකොඩි ආරච්චිලාගේ පද්මා ජයකොඩි යන අය විසින් අනවසරයෙන් භුක්ති විඳී, මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මැදිරිගිරිය සංවර්ධන කටයුතු සඳහා අත්පත් කර ගැනීමට යෝජිත බිම් කොටස; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1709.

**02. කැබලි අංක A 387**

ඉඩමේ නම: එකමුතුගම ලඳු කැලය; විස්තරය: අංක 344, යාය 09, අඹගස්වැව පදිංචි ජේ. එම්. දිලිනි මධුෂිකා ජයසුන්දර යන අය විසින් අනවසරයෙන් භුක්ති විඳී. මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මැදිරිගිරිය සංවර්ධන කටයුතු සඳහා අත්පත් කර ගැනීමට යෝජිත බිම් කොටස; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.2495.

**03. කැබලි අංක A 388**

ඉඩමේ නම: එකමුතුගම ලඳු කැලය; විස්තරය: අංක 344, යාය 09, අඹගස්වැව පදිංචි ජේ. එම්. දිලිනි මධුෂිකා ජයසුන්දර යන අය විසින් අනවසරයෙන් භුක්ති විඳී. මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මැදිරිගිරිය සංවර්ධන කටයුතු සඳහා අත්පත් කර ගැනීමට යෝජිත බිම් කොටස; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0337.

**04. කැබලි අංක A 389**

ඉඩමේ නම: එකමුතුගම; විස්තරය: ගෙවත්ත, තාවකාලික ගොඩනැගිල්ල සහිත මිශ්‍ර බෝග වගාව එකමුතුගම 3 වන පියවර පදිංචි ජයසුන්දර මුදියන්සේලාගේ සරත් ජයසුන්දර යන අය විසින් අනවසරයෙන් භුක්ති විඳී. මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මැදිරිගිරිය සංවර්ධන කටයුතු සඳහා අත්පත් කර ගැනීමට යෝජිත බිම් කොටස; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0724.

**05. කැබලි අංක A 390**

ඉඩමේ නම: එකමුතුගම විවෘත මුඩුබිම; විස්තරය: ගෙවත්ත, තාවකාලික ගොඩනැගිල්ල සහිත මිශ්‍ර බෝග වගාව එකමුතුගම 3 වන පියවර පදිංචි ජයසුන්දර මුදියන්සේලාගේ සරත් ජයසුන්දර යන අය විසින් අනවසරයෙන් භුක්ති විඳී. මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මැදිරිගිරිය අප ප්‍රධාන ඇල ඉදිකිරීම සඳහා අත්පත් කර ගැනීමට යෝජිත බිම් කොටස; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0805.

**06. කැබලි අංක A 391**

ඉඩමේ නම: එකමුතුගම විවෘත මුඩුබිම; විස්තරය: අංක 270, යාය 09, පහළ අඹගස්වැව පදිංචි හේනේ ජයරත්න බණ්ඩාර යන අය විසින් අනවසරයෙන් භුක්ති විඳී. මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මැදිරිගිරිය සංවර්ධන කටයුතු සඳහා අත්පත් කර ගැනීමට යෝජිත බිම් කොටස; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1293.

**07. කැබලි අංක A 392**

ඉඩමේ නම: එකමුතුගම; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් සහිත මිශ්‍ර බෝග වගාව, අංක 270, යාය 09, පහළ අඹගස්වැව පදිංචි හේනේ ජයරත්න බණ්ඩාර අය විසින් අනවරයෙන් භුක්ති විඳී. මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මැදිරිගිරිය සංවර්ධන කටයුතු සඳහා අත්පත් කර ගැනීමට යෝජිත බිම් කොටස; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 1220.

**08. කැබලි අංක A 393**

ඉඩමේ නම: එකමුතුගම ලඳු කැලය; විස්තරය: අංක 393, යාය 09, අඹගස්වැව පදිංචි ගලබලන දේවගේ නාලිකා චාන්දනී යන අය විසින් අනවරයෙන් භුක්ති විඳී. මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මැදිරිගිරිය සංවර්ධන කටයුතු සඳහා අත්පත් කර ගැනීමට යෝජිත බිම් කොටස; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: වර්ග මීටර් 16

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020. 01.21 දින පෙ. ව. 9.00ට මැදිරිගිරිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද 2020.01.10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම සම්බන්ධයෙන් වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් ඉල්ලා සිටින වන්දි මුදල හා ඒ වන්දි මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් ඉදිරිපත් කළ යුතුය.

සී. එම්. කරුණාරත්න,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මැදිරිගිරිය.

2019 නොවැම්බර් මස 19 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මැදිරිගිරිය.

1-83

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.